ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL' S DEPARTMENT

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2684051

නො.07,ග්‍රෙගරි මාවත, කොළඹ 07.
இல 7 ,கிரகறிஸ் மாவத்தை கொழும்பு 07
No 07 Gregory's Avenue Colombo 07

ඊමේල් / ஈ - மெயில் / E-mail: Landcom@sltnet.lk

මගේ අංකය / எனது இல / MY NO: 5/2/6/චක්‍රලේඛ(1)
ඔබේ අංකය / உமது இல / YOUR NO:
දිනය / திகதி / DATE: 2006.04. 28

චක්‍රලේඛ අංක :- 2006/02

සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන්,

අන්තර් පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් වරුන් වෙත.

**<u>ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය කිරීම.</u>**

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දැනට බෙදා දී ඇති රජයේ ඉඩම් භුක්ති විඳින විවිධ පංති වලට අයත් ජනතාවගේ සමාජමය හා ආර්ථිකමය ප්‍රශ්න රැසක් කෙරේ බලපෑම් කරනු ලැබ ඇති ගැටළු අවම කර ගැනීම සඳහා රජය විසින් ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය කිරීමට තීරණය කර ඇත. මෙම සංශෝධන ඇතුලත් නීති කෙටුම්පත් කටයුතු අවසන් වෙමින් පවතින අතර නව නොබෝ දිනකින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර සම්මත කර ගැනීමට නියමිතය.

එම සංශෝධන අනුමත කරන තෙක් "අනුප්‍රාප්තිකයන්" නම් කිරීම පිලිබඳව පහත සඳහන් සීමාවන් පැනවීමට ගරු ඉඩම් විෂය භාර අමාත්‍ය තුමා අදහස් කර ඇති බවත් ඒ අනුව ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් කෘෂිකර්ම සංවර්ධන හා ඉඩම් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් මා වෙත දන්වා ඇත.

ඒ අනුව,

01. බලපත්‍රකරු හෝ දීමනාපත්‍රකරු ඉඩම සඳහා අනු ප්‍රාප්තිකයෙකු නම් නොකර මිය ගිය අවස්ථාවක එම ඉඩමේ උරුමය හිමි වී ඇති අයගේ උරුම බලපත්‍රයේ, ලෙජරයේ සහතික කිරීම හෝ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියවිල්ලක් ලියාපදිංචි කිරීම මගින් සහතික කිරීම සඳහා යොදා ඇති පරිපාලනමය විධි විධාන වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන්න.

02. යම් ඉඩමක උරුමය පිලිබඳ ආරවුලක් පවතින අවස්ථාවකදී ඉඩම් සංවර්ධන ආඥා පනතේ III උපලේඛනයේ 1 හා 2 රීතිය යටතේ සුදුසු ඥාතියෙකු තෝරා ගැනීමේ කටයුතු ඉහත සඳහන් සංශෝධන පාර්ලිමේන්තුව මගින් සම්මත කරන තෙක් ප්‍රමාද කරන්න.

කාර්යාලය / பொது: 2677166 | ආයතන / நிர்வாகம்: 2671173 | ගිණුම් / கணக்கு: 2675574 | ඉඩම් / காணி / Land: 2675576 | සංවර්ධන / அபிவிருத்தி / Development: 2677293

එසේ වුවත් මුල් බලපත්‍රකරු හෝ මුල් දීමනාපත්‍රකරු විසින් ඉල්ලා සිටින අනුප්‍රාප්තිකයන් නම කිරීමක් හෝ අවලංගු කිරීමක් ඉහත විධි විධාන වලින් වලකා ඇතැයි නොසිතිය යුතු බව කරුණාකර සලකන්න. මෙම උපදෙස් ඔබගේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල වෙත නොපමාව ලබාදෙන්නේ නම් මැනවි.

එස්. සී. ඒ. බී. බොරලැස්ස
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :-

1. ලේකම්, කෘෂිකර්ම සංවර්ධන හා ඉඩම් විෂය භාර අමාත්‍යාංශය - ඔබේ අංක එල්ඩී/4/6/7 හා 2006.04.27 ලිපිය අනුව දැන ගැනීම පිණිස.
2. රෙජිස්ට්‍රාර් ජනරාල් : අංක 1 තීරයේ දක්වා ඇති ලියවිලි ලියාපදිංචි කිරීම තාවකාලිකව අත්හිටුවීම සම්බන්ධ උපදෙස් දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත ලබාදීම සඳහා.
3. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - දැ. ගැ. පි. / අ. ක. ස.
4. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් - දැ. ගැ. පි. / අ. ක. ස.